*සැ. යු.* - (i) 2012.07.20 දින පළ වූ අංක 1,768 දරන *ගැසට් පත්‍රයේ* I,III සහ IV (අ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2008 වර්ෂයේ ජූලි - සැප්තැම්බර් කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1769 - 2012 ජූලි 27 වැනි සිකුරාදා - 2012.07.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1198 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1200 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | -- |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

 - B 80633— 7,100 (2012/07)
F 1 –

# පළාත් පාලන නිවේදන

## හක්මණ ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 දරන වගන්තිවලින් මෙම ප්‍රාදේශීය සභාවට ලබාදී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව අංක 520/7 හා 1988.08.23 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, 1989 අංක 12 දරන පළාත්පාලන (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 (3) වගන්තිය අනුව දකුණු පළාත් සභාව විසින් පිළිගත් බවට අංක 1162 හා 2000.12.08 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ ප්‍රකාශිත වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 21 හැර අංක 01 සිට 42 දක්වා අතුරු ව්‍යවස්ථා ඒ ආකාරයෙන් පිළිගැනීමටත් අංක 21 අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනය සඳහා පහත උපලේඛනයේ දැක්වෙන වෙළඳ ව්‍යාපාරයන් ඇතුළත් කොට පිළිගැනීමටත් මෙම නිවේදනය *ගැසට් නිවේදනයේ* පළවන දින සිට ක්‍රියාත්මක වන බවත් 2012.03.27 වැනි දින තීරක අංක 12/1 යටතේ පැවති සභා රැස්වීමේ දී ගරු සභාපති සී. පී. එච්. හල්පගේ මහතා විසින් යෝජනා කරන ලද අතර, එම තීරණය ගරු උපසභාපති ඩබ්. එස්. පී. කේ. අමරසේකර මහතා විසින් ස්ථිරකර ගරු සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

සී. ජී. එච්. හල්පගේ,
සභාපති,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2012 අප්‍රේල් මස 09 වැනි දින,
හක්මන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම්*

01. කළුගල් වලක් හෝ යාන්ත්‍රික කළුගල් මෝලක් පවත්වාගෙන යාම
02. කළුගල් කඩා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. වී මෝලක් පවත්වාගෙන යාම
04. පෙට්‍රල් ඩීසල් හෝ භූමිතෙල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
05. කම්මලක් පවත්වාගෙන යාම
06. පොල්තෙල් මෝලක්/පොල්තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
07. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (ඩිජිටල්)
08. අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
09. දැව ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10. මෝටර් රථ ගරාජයක් පවත්වාගෙන යාම
11. මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
12. යතුරු පැදි හා ත්‍රිරෝද රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
13. එල්. පී, ගෑස් විකිණීමට ගබඩා කර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
14. කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික පොහොර තොග වශයෙන් ගඩබා කිරීමේ ස්ථානයක් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. මැණික් ගැරීම හෝ පතල් කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
17. වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
18. අම්ලකර වායුවෙන් පැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. යන්ත්‍රානුසාරයෙන් මිරිස් තුනපහ ඇඹරීම හෝ පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20. යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම
21. වඩුමඩුවක් පවත්වාගෙන යාම
22. කොප්පරා නිපදවීම, සැකසීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23. ගිණිපෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. වීදුරු කපා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. තීන්ත, වාර්නිස්, ඩිස්ටැම්පර්, වර්ග ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. ඇස්බැස්ටෝස් තහඩු වර්ග විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. විකිණීම සඳහා තේ කුඩු තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. රබර් කිරි එකතු කිරීම හෝ රබර් සීට් නිෂ්පාදනය කිරීමේ දුම් කාමරයක් පවත්වාගෙන යාම
30. සජීවී සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
32. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

33. ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. සිසිල්බීම නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. අයිස්ක්‍රීම් හෝ බීම පැකට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙනයාම
37. කුරුඳු බේල් කිරීමේ හෝ කුරුඳු කපා සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. දුම්කොළ ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම
39. උළු හෝ ගඩොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. ආහාර ද්‍රව්‍ය ගබඩා කර තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. ගෑස් ගබඩා කිරීමේ හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. කුරුඳු සකස්කර ගෙන්දගම් දුම්ගැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. සිමෙන්ති මිශ්‍ර ගඩොල් හෝ හියුම් පයිප්ප නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. කොහු නිපදවීම හා ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. ස්වර්ණාභරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. අළුත් ටයර් හෝ රීබිල්ට් ටයර් හෝ පැරණි ටයර් ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
50. ලෝහමය සුන්බුන් හෝ බෝතල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. යෝගට් මුදවාපු කිරි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. මීනී පෙට්ටි නිපදවීම හා ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. පොල්කටු අඟුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම
55. පොලිතීන් නිෂ්පාදන ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. රස කැවිලි හෝ බයිට් වර්ග නිපදවීමේ ස්ථානයක් පත්වාගෙන යාම
57. ලුණු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

07-757

---

## කෑගල්ල නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයන්හි නම සඳහන් තැනැත්තා විසින් එකී නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2013 වර්ෂයට බලපත්‍රයක් ලබාගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරුද්ධත්වයට හේතුව ලියවිල්ලකින් දන්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

පී. කේ. සමරසිංහ,
සභාපති,
නගර සභාව - කෑගල්ල.

2012 ජූලි මස 09 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල් අංක 167/28, ඔලගම, කෑගල්ල | සභාපති | බ්ලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක 152, කළුගල්ල මාවත, කෑගල්ල. |

07-758

# අතුරු ව්‍යවස්ථා

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් මහ ඇමති මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු බලතල අනුව තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම,
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය.

දෙදහස් දොළහ වර්ෂයේ ජූනි මස 25 වැනි දින,
මහ ඇමති කාර්යාලය,
නැගෙනහිර පළාත,
වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතලය අනුව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතලය අනුව ද තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව විසින් 2011.12.28 දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 06/07 දරණ තීරණය මත මෙම අතුරු ව්‍යස්ථාව සකස් කර සම්මත කරණු ලැබේ.

*පොදු :*

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ / ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුද්‍රාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරණ ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේ ය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකල යුත්තේ ය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කල විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උපවගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්‍ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේය.

(vii) උපවගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතු ය.

*(අ)* මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊළඟ මස 15 වැනි දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය.

*(ආ)* වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 වැනි දිනට පෙර ගෙවිය යුතු ය.

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට /ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය.

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි ; හෝ

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකි ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතු වන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවේ භාරදිය යුත්තේය.

(v) සෑම තැනැත්තෙක් ම ඔහුගේ / ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යක් වාහනයක සිට වීදියකට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේය.

(vii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ / ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම් පත්‍රයේ ඇතුළත් කළ යුත්තේය.

**නිවාස පරිශ්‍රයන් :**

8. (i) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. (i) ඡේදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) සෑම හිමිකරුවෙකුට ම හෝ පදිංචි කරුවෙකුට ම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාළ අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදිය යුතු ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්‍ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය.

(iii) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වැනි උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. **සාප්පු හා කාර්යාල** :

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක් ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේය.

(v) (iv) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුළට දැමිය යුතු වන්නේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන්ව ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළ හොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේ ම වගකීම වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම්,

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

11. **භෝජනාගාරය :**

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක් ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම් වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරි කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුම් ඇසිරිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක්ද ඇතුළත් වේ.

12. **එළවළු සහ පළතුරු වෙළඳසැල් :**

(i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල්වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි ඃ*

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය ඃ-

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුළත තැබිය යුතු අතර එය නිසි ලෙස සුරක්ෂිත බහාලුමක කර තැබිය යුත්තේ ය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුහට භාරදිය හැක්කේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යයන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම ඃ*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියාගෙන් ඉල්ලුම් කළ යුතු ය.

(iii) උපවගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උපවගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසියම් අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හා සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථාවලදී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතු ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා :*

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''කර්මාන්තශාලාවම'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාළ වන්නේ ය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම :*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම්, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකුද ඇතුළත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේ දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේ ය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම්වරයා දැනුම් දිය යුතු ය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වැනි උපවගන්තිය යටතේ කරනු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම් වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරන ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කළ හැකිය.

(iii) උපවගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උපවගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා*

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රව්‍යකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේ ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස -

''ආරෝග්‍යශාලාව'', යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක් / සත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රව්‍යකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදැමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ත්ව ඝාතකාගාර*

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර ආඥාපනතේ (272 පරිච්ඡේදයේ) විධිවිධානවලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතුය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උපවගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් ඝන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.

*(අ)* සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය ,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දුනොවන පරිදි භාජන තුල තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේ ය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vi) සත්ව ඝාතකාගාර මඟින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේ ය.

''සත්ත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ව ආඥාපනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාල වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර*

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේ ය. එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශිය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන සේවා ගාස්තුවකට අනුකූලවේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

21. *වීදි සහ පොදු ස්ථාන*

(i) ලේකම් වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය :-

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම ;

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;

*(ඇ)* උත්සවවල දී විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම;

*(ඈ)* නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වාණිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම*

(i) ලේකම්වරයා සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය :-

(අ) අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම;

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම;

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතු වල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම;

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම;

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම;

(ඊ) ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම;

(උ) තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුලත් කිරීම;

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම;

(එ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම;

(ඒ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම් වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම;

(ඔ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුලත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන, වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම ;

(ඕ) මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම;

(ක) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම;

(ග) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(ජ) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම ;

(ට) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම;

(ඩ) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම;

*(ද)* (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුළත විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. *බලපත්‍ර*

(i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

*(අ)* වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක;

*(ආ)* සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම;

*(ඇ)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම;

*(ඈ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම;

*(ඉ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම;

*(ඊ)* අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම;

*(උ)* සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය;

*(ඌ)* ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දක්විය යුත්තේ ය;

*(එ)* (ii) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය;

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ*

(i) සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

(ii) අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේය.

25. *වෙනත්*

(i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

(iv) සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලය ලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම්*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මෙම උප වගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධි විධාන උල්ලංඝනය කලහොත් හෝ නොසැළකිල්ල කලහොත් ලේකම් වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කල යුතු චෝදනාවක් වේ.

(අ) යම් ආකාරයකින් එවැනි උල්ලංඝණයක් හෝ නොසැළකිල්ලතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක් ,

(ආ) එසේ උල්ලංඝණය හෝ නොසැළකිල්ලතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ.

27. *අර්ථ නිරූපනය* ඃ

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවුත්, සැකසුම් නොකරණ ලද්දාවුත් පිරියම් නොකරන ලද්දාවුත් සියලූම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුලත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස්,බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස් වලින් හෝ පැල වලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරි අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දැවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දැවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණ ශිලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් අටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුලත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

' 'සභාව'' යන්නෙන් තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කි වලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැඟිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ග වලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේදී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

උපලේඛනය 01

*සේවා ගාස්තු :*

| *සේවා ගාස්තු විස්තරය* | *උප වගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය* | | | *උප වගන්ති 10 ,11 ,12, 13 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය* |
|---|---|---|---|---|
| | *උප වගන්ති 8 යටතේ* | *උප වගන්ති 9 යටතේ* | *උප වගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන්* | |
| | (රු:) | (රු:) | (රු:) | (රු:) |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10 ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්ථයක් වශයෙන් පදනම් කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරණය කරණු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"සමෘද්ධි ලාභීන්" යනුවෙන් හඳුනා ගන්නේ අදාල ප්‍රාදේශිය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිලිඳු කම පිටුදැකීම ව්‍යාපාරය යටතේ අධාර ලබන්නන් ද එයට අදාල වේ.

07-644/1

---

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

## සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාව

නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු බලතල අනුව සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,<br>
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,<br>
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම,<br>
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,<br>
නීතිය හා විධාන, පලාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය,

දෙදහස් දොළහ වර්ෂයේ ජූනි මස 25 වැනි දින,<br>
මහඇමති කාර්යාලය,<br>
නැගෙනහිර පළාත,<br>
වරෝදය නගර්,<br>
ත්‍රිකුණාමලය.

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතල අනුව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතල අනුව ද සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාව විසින් 2011.10.24 දිනැති පවත්වනු ලබන අංක 07 දරන රැස්වීමේ දී අංක 01 දරන තීරණය මත මෙම අතුරු ව්‍යස්ථාව සකස් කර සම්මත කරණු ලැබේ.

පොදු :

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත් වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුලත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ / ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථා වල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේ'ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරන ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර, හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරුවී, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේ ය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කල විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණ අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උප වගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරි වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

(vii) උප වගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18 හා 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතුය :-

*(අ)* මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊළඟ මස 15 දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය.

*(ආ)* වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 දිනට පෙර ගෙවිය යුතු ය.

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුල විවෘත භූමියක පරිසරයට හානිකරවන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට /ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුලතම බැහැර කළ හැකිය :-

(අ) සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි ; හෝ

(ආ) සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම් වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කල හැකිය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුලත එකතුවන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවට භාරදිය යුත්තේ ය.

(v) සෑම තැනැත්තෙක්ම ඔහුගේ / ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වාවන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(vii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ / ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රයේ ඇතුලත් කළ යුත්තේ ය.

*නිවාස පරිශ්‍රයන් :*

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය ;
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡෙදය (අ) සහ (ආ) වල සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචි කරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාල අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදිය යුතුය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර, සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වැනි උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලවීමට අපොහොසත්වන අවස්ථාවකදී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාල බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතුය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

10. *සාප්පු හා කාර්යාල :*

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය;
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(v) (iv) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුලට දැමිය යුතු වන්නේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන්ව ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකල හොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය.

(vii) අසල්වාසීන්ට හෝ ඒකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් -

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

''කාර්යාලය'' යන්න 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුලත් වේ.

11. *භෝජනාගාරය :*

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කල යුත්තේ ය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උප වගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

12. *එළවළු සහ පළතුරු වෙළඳසැල්*

(i) සෑම එළවළු හෝ පලතුරු වෙළඳ සැලක ම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන් හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළ් වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන් හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි* :

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුළත තැබිය යුතු අතර එම නිසි ලෙස සුරක්ෂිත බහාලුමක කර තැබිය යුත්තේය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන් හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සාභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියා ගෙන් ඉල්ලුම් කළ යුතු ය.

(iii) උපවගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උප වගන්ති (ii) හි ලබාගත් අත්තිකාරමෙන් අඩුකර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසියම් අපද්‍රව්‍යක් පදික වේදිකාවේ මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හා සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවුත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථාවලදී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතු ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නා වූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා*

(i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිශ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කර්මාන්තශාලාවම'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාළ වන්නේය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක් ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් ඒකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුළත හෝ ලේකම් වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම් වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරිමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේදී දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් විදීයක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම් වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම්වරයා දැනුම් දිය යුතු ය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වැනි උපවගන්තිය යටතේ කරණු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම්වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කල වියදමට සමාන මුදලක් ඉල්ලුම් කල තැනැත්තා විසින් තැන්පත් කරණු ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කල හැකිය.

(iii) උපවගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උපවගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා*

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රව්‍යකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම් වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස

''ආරෝග්‍යශාලාව,, යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රව්‍යකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය,, යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය ශරීර කොටස්, වැදෑමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ත්ව ඝාතකාගාර*

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර අඥාපනතේ (272 පරිච්ඡෙදයේ) විධි විධාන වලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ.) ඔවුන් සත අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.

*(අ)* සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය ,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දුනොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමින් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වන උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vi) සත්ත්ව ඝාතකාගාර මඟින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේ ය.

''සත්ත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව ආඥා පනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර* :

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) (i) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස, ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දනුම්දිය යුත්තේය.එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශිය සභාව විසින් කලින් කලට තීරණය කරණු ලබන සේවා ගාස්තුවකට අනුකූලවේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

21. *වීදි සහ පොදු ස්ථාන* :

(i) ලේකම් වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය.

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සවවලදී විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථා වලදී සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායක වරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම.

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම* :

(i) ලේකම්වරයා සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම.

(උ) තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුලත් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(එ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(ඒ) අන්තරාකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම්වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

(ඔ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඕ) මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරාකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ක) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

(ග) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම් අත් ආවරණ මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

*(ජ)* නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

*(ට)* සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

*(ඩ)* 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාල නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

*(ද)* (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාල වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුලත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුලත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. *බලපත්‍ර* :

(i) අපද්‍රව්‍ය ප්‍රති භාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

*(අ)* වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

*(ආ)* සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුලත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ඇ)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඈ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

*(ඉ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

*(ඊ)* අදාල ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුලත කරගෙන යනු ලබන විටෙකදී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

*(උ)* සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුලත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

*(ඌ)* ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දක්විය යුත්තේ ය.

*(එ)* (ii) වන උප වගන්තියේ විධි විධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ* :

(i) සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

(ii) අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකල යුත්තේ ය.

25. *වෙනත් ඃ*

(i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලූ සාධාරණ වේලාවන්හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු පදිංචිකරු භාරකරු කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම් වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

(iv) සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම්*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මෙම උප වගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධි විධාන උල්ලංඝනය කලහොත් හෝ නොසැළකිල්ල කලහොත් ලේකම් වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කල යුතු චෝදනාවක් වේ.

(අ) යම් ආකාරයකින් එවැනි උල්ලංඝණයක් හෝ නොසැළකිල්ලතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක්,

(ආ) එසේ උල්ලංඝණය හෝ නොසැළකිල්ලතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ.

27. *අර්ථ නිරූපනය*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක් බඳුනක් උරයක් මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වූත් ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත් සැකසුම් නොකරණ ලද්දාවූත් පිරියම් නොකර ලද්දාවූත් සියලූම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුලත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස් මාළු කුකුල් මස් බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස් වලින් හෝ පැල වලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් අටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුලත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කි වලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහ ජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ග වලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේදී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

උපලේඛන 01

සේවා ගාස්තු

| සේවා ගාස්තු විස්තරය | උප වගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය | | | උප වගන්ති 10 ,11 ,12, 13 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය |
|---|---|---|---|---|
| | උප වගන්ති 8 යටතේ | උප වගන්ති 9 යටතේ | උප වගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන් | |
| | *(රු.)* | *(රු.)* | *(රු.)* | *(රු.)* |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්ථයක් වශයෙන් පදනම්කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරණය කරනු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"සමෘද්ධි ලාභීන්" යනුවෙන් හඳුනා ගන්නේ අදාල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිළිඳුකම පිටුදැකීම ව්‍යාපාරය යටතේ අධාර ලබන්නන් ද එයට අදාල වේ.

07-644/2

---

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු බලතල අනුව අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්,
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය,

දෙදහස් දොළහ වර්ෂයේ ජුනි මස 25 දින,
මහඇමති කාර්යාලය,
නැගෙනහිර පළාත,
වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතලය අනුව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතලය අනුවද අඬ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව විසින් 2011.11.24 දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 73 දරන තීරණය මත මෙම අතුරු ව්‍යවස්ථාව සකස් කර සම්මත කරණු ලැබේ.

පොදු :

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. අඬ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත් වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුලත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම ඔහුගේ / ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථා වල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරණ ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේ ය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේ ය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කළ විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකි ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උප වගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

(vii) උප වගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන්කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උප ලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතු ය.

(අ) මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊලග මස 15 දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය.

(ආ) වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 දිනට පෙර ගෙවිය යුතු ය.

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකල යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට /ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුලතම බැහැර කළ හැකි ය.

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම්කර ඇති ප්‍රදේශයන්හි හෝ

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම් වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකි ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුලත එකතුවන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම් වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේ ය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැළකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවට භාරදිය යුත්තේය.

(v) සෑම තැනැත්තෙක්ම ඔහුගේ / ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වාවන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(vii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ / ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම් පත්‍රයේ ඇතුලත් කළ යුත්තේ ය.

*නිවාස පරිශ්‍රයන්* :

8. (i) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම් වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡේදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමින් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) සෑම හිමිකරුවෙකුට ම හෝ පදිංචි කරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන්කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන්කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාල අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක්රැස් කරන්න්ට භාරදිය යුතු ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක් ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේ යඃ-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) (i) වන ඡේදයේ නිශ්චිතව සඳහන්කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේ ය.

(iii) (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වන උප වගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවකදී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම් වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම් වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතුය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන්කර ඇති අපද්‍රව්‍ය වර්ගද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

10. *සාප්පු හා කාර්යාල :*

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක් ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(v) (iv) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුලට දැමිය යුතු වන්නේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළ හොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීය යුතු ය.

(vii) අසල්වාසීන්ට හෝ ඒකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියමකර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම්,

''පදිංචිකරු,, යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරු ය.

''කාර්යාලය,, යන්නට 1954 අංක 19 දරණ සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වන අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව,, යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක්වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුලත් වේ.

11. *භෝජනාගාරය :*

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණිය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුම් ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යක් සහ (i) වැනි උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුලත් වේ.

12. *එළවළු සහ පලතුරු වෙළඳසැල් ඃ*

(i) සෑම එළවළු හෝ පලතුරු වෙළඳ සැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය ඃ-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුලට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල් වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''එළවළු හා පලතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පලතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි ඃ*

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය .

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුලත තැබිය යුතු අතර එම නිසි ලෙස සුරක්ෂිත බහාලුමක කර තැබිය යුත්තේ ය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම* :

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාල වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියාගෙන් ඉල්ලුම් කළ යුතු ය.

(iii) උපවගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උපවගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම් වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසියම් අපද්‍රව්‍යක් පදික වේදිකාවේ මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හා සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවුත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථා වලදී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතු ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා* :

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිශ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුල ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරි අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කර්මාන්තශාලාවම'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාල වන්නේ ය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම :*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් ඒකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුලත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම් වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකුද ඇතුලත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේදී දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම් වරයා දැනුම් දිය යුතු ය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වැනි උපවගන්තිය යටතේ කරණු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම්වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරන ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කළ හැකිය.

(iii) උපවගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උප වගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා :*

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතු ය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුල ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම් වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි

විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස,

''ආරෝග්‍යශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රව්‍යකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය ශරීර කොටස්, වැදැමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. **සත්ත්ව ඝාතකාගාර** :

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර අඥාපනතේ (272 පරිච්ඡේදයේ) විධි විධාන වලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උපවගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් ඝන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.

*(අ)* සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දුනොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) සත්ත්ව ඝාතකාගාර මගින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියාකළ යුතු වන්නේ ය.

''සත්ත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව අඥාපනතින් (272 පරිච්ඡෙදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. **වෙනත් පරිශ්‍ර** :

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේය.එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන සේවා ගාස්තුවකට අනුකූලවේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම් වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

21. **වීදි සහ පොදු ස්ථාන :**

(i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡාකර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතු ය.

(අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

(ආ) වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සව වලදී විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථා වලදී සභාවෙන් තීරණයක් කරනවිටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායක වරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම.

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කි වල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්ති වල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

22. **ප්‍රාදේශීය සභාවේ යුතුකම :**

(i) ලේකම්වරයා සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේය.

(අ) අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතු වල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම.

(උ) තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිලියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

*(එ)* බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

*(ඒ)* අන්තරාකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම් වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

*(ඔ)* ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

*(ඕ)* මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡාකර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලූම අන්තරාකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

*(ක)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

*(ග)* අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුට ම සුදුසු ඇඳුම් අත් ආවරණ මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

*(ජ)* නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති  අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේදී හා නිමවීමේදී සක්කගල් ගබඩා කරනු, සකසණු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

*(ට)* සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

*(ඩ)* 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

*(ද)* (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුළත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. **බලපත්‍ර** :

(i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

*(අ)* වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

*(ආ)* සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත හෝ වෙනත් පලාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ඇ)* 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඈ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

*(ඉ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

*(ඊ)* අදාළ ව්‍යාපාරය  ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වු හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

*(උ)* සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය.

(ඇ) ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සභා වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේය.

(එ) (ii) වන උප වගන්තියේ විධි විධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය.

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ*

(i) සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේය.

(ii) අනුමත කිරීමේ යම් කොන්දේසි වලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේය.

25. *වෙනත්*

(i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු පදිංචිකරු භාරකරු කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම් වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

(iv) සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලය ලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම්*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල මෙම උප වගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධි විධාන උල්ලංඝනය කලහොත් හෝ නොසැළකිල්ල කලහොත් ලේකම් වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කළ යුතු චෝදනාවක් වේ.

*(අ)* යම් ආකාරයකින් එවැනි උල්ලංඝණයක් හෝ නොසැළකිල්ලතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක්

*(ආ)* එසේ උල්ලංඝණය හෝ නොසැළකිල්ලතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ

27. *අර්ථ නිරූපනය*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේවන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක් බඳුනක් උරයක් මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වූත් ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත් සැකසුම් නොකරණ ලද්දාවූත් පිරියම් නොකර ලද්දාවූත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුලත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස් මාළු කුකුල් මස් බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස් වලින් හෝ පැල වලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරි අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුලත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කි වලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැඟිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහ ජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ග වලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේදී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

*උපලේඛන 01*
*සේවා ගාස්තු :*

| *සේවා ගාස්තු විස්තරය* | *උප වගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය* | | | *උප වගන්ති 10 ,11 ,12, 13 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය* |
|---|---|---|---|---|
| | *උපවගන්ති 8 යටතේ* | *උපවගන්ති 9 යටතේ* | *උපවගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන්* | |
| | *(රු.)* | *(රු.)* | *(රු.)* | *(රු.)* |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්තයක් වශයෙන් පදනම් කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරණය කරනු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

සමෘද්ධිලාභීන් යනුවෙන් හඳුනා ගන්නේ අදාල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිළිඳුකම පිටුදැකීම ව්‍යාපාරය යටතේ ආධාර ලබන්නන් ද එයට අදාල වේ.

07-644/3

---

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු බලතල අනුව කාරතිවු ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්,
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය.

දෙදහස් දොළහ වර්ෂයේ ජුනි මස 25 වැනි දින,
මහඇමති කාර්යාලය,
නැගෙනහිර පළාත,
වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

කාරතිවු ප්‍රාදේශීය සභාව

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

කාරතිවු ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතල අනුව ද 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතල අනුව ද කාරතිවු ප්‍රාදේශීය සභාව විසින් 2011.10.28 දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 29/03 දරන තීරණය මත මෙම අතුරු ව්‍යවස්ථාව සකස් කර සම්මත කරනු ලැබේ.

පොදු :

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. කාරතිවු ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේය.

05. *(i)* පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ/ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේය.

*(ii)* සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේය.

*(iii)* හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරන ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේය.

*(iv)* හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කළ විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

*(v)* හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උප වගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

*(vi)* හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේය.

*(vii)* උපවගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතු යඃ-

(අ) මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊළඟ මස 15 දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය ;

(ආ) වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 දිනට පෙර ගෙවිය යුතු ය.

6. *(i)* කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේය.

*(ii)* කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේය.

*(iii)* යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට/ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

*(iv)* අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේය.

7. *(i)* යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය :-

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි ; හෝ

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

*(ii)* පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

*(iii)* හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතු වන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේය.

*(iv)* වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවේ භාරදිය යුත්තේය.

*(v)* සෑම තැනැත්තෙක්ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

*(vi)* කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේය.

*(vii)* නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ /ඇයගේ අයදුම් පත්‍රයේ ඇතුළත් කළ යුත්තේය.

*නිවාස පරිශ්‍රයන් :*

8. *(i)* සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

*(ii)* සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡෙදය (අ) සහ (ආ) වලින් සදහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

*(iii)* සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාල අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදිය යුතු ය.

9. *(i)* කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

*(ii)* (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්‍ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය.

*(iii)* (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වැනි උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

*(iv)* ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාල බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතු ය.

*(v)* මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. *සාප්පු හා කාර්යාල ඃ*

*(i)* සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය ඃ-

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

*(ii)* තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

*(iii)* සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

*(iv)* මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේය.

*(v)* (iv) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුළට දැමිය යුතු වන්නේය.

*(vi)* මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන්ව ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළහොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vii) අසල්වාසීන්ට හෝ ඒකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්‍ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් -

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය;

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව,'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළෙඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

11. *භෝජනාගාරය* :

*(i)* යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

*(ii)* සෑම භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

*(iii)* සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

*(iv)* මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

*(v)* මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මද්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

12. *එළවළු සහ පළතුරු වෙළඳසල්* :

(i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳසලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල් වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළෙඳ කුටි* :

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුලත තැබිය යුතු අතර එම නිසි ලෙස සුරක්ෂිත බහාලුමක කර තැබිය යුත්තේය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම :*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සාභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම් වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියා ගෙන් ඉල්ලුම් කළ යුතුය.

(iii) උප වගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උප වගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම් වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසියම් අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂි අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුලට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථා වලදී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා :*

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිශ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරි අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කර්මාන්තශාලාවම'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ තිබෙන අර්ථය අදාළ වන්නේ ය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම :*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් ඒකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුලත හෝ ලේකම් වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකුද ඇතුලත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැඟිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේදී දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු ඒකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම් වරයා දැනුම් දිය යුතුය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වන උපවගන්තිය යටතේ කරනු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම් වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරනු ලෙසට ලේකම්වරයාට ඉල්ලීමක් කල හැකිය.

(iii) උප වගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට ඒකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර, ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උප වගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා :*

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය
*(ඈ)* උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය

(ii) (i) වන උප වගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම් වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වන උප වගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේය.

(iii) (i) වන උප වගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස -

''ආරෝග්‍යශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුලත් වේ.

''උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදැමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ත්ව ඝාතකාගාර*

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර අඥා පනතේ (272 පරිච්දෙයේ) විධි විධාන වලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතුය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උප වගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් ඝන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.

(අ) සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දුනොවන පරිදි භාජන තුල තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වන උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) සත්ත්ව ඝාතකාගාර මගින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කල යුතු වන්නේය.

''සත්ත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව අඥා පනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර*

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන

හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය

(ii) (i) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේය.එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන සේවා ගාස්තුවකට අනුකූලවේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම් වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

21. *වීදි සහ පොදු ස්ථාන*

(i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය.

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම.

*(ඇ)* උත්සව වලදී විශේෂ සිදුවීම් අවස්ථා වලදී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවලදී සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම.

*(ඈ)* නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කි වල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

*(ඉ)* පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම*

(i) ලේකම්වරයා සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේය.

*(අ)* අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම.

*(ආ)* අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

*(ඇ)* ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

*(ඈ)* අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම.

*(ඉ)* අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

*(ඊ)* ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම.

(උ) තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුලත් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(එ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(ඒ) අන්තරාකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම් වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

(ඔ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුලත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ග වල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඕ) මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරාකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ක) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

(ග) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම් අත් ආවරණ මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(ජ) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේදී හා නිමවීමේදී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(ට) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

(ඩ) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාල නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

(ද) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාල වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුලත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුලත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. *බලපත්‍ර*

(i) අපද්‍රව්‍ය ප්‍රති භාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

(ආ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුලත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

(ඉ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

(ඊ) අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුලත කරගෙන යනු ලබන විටෙකදී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේ

දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

*(උ)* සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය.

*(ඌ)* ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සභ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

*(එ)* (ii) වැනි උප වගන්තියේ විධි විධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ :*

(i) සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

(ii) අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

25. *වෙනත් :*

(i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලූ සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම් වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

(iv) සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලය ලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම් :*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මෙම උප වගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධි විධාන උල්ලංඝනය කලහොත් හෝ නොසැළකිල්ල කලහොත් ලේකම් වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කළ යුතු චෝදනාවක් වේ.

(අ) යම් ආකාරයකින් එවැනි උල්ලංඝණයක් හෝ නොසැළකිල්ලතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක් ;

(ආ) එසේ උල්ලංඝණය හෝ නොසැළකිල්ලතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ .

27. *අර්ථ නිරූපනය :*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මඟින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වුත් ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවුත්, සැකසුම් නොකරන ලද්දාවුත්, පිරියම් නොකර ලද්දාවුත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුළත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස් , බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැලවලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරි අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දැවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දැවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් අටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත, කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

' 'සභාව'' යන්නෙන් කාරතිවු ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.
''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහ ජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ

ලේකම්වරයාගේ බලතල, යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විථි ශුද්ධ කිරීමේ දී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරු කිරීම එහි දී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

**උපලේඛන 01**

*සේවා ගාස්තු :*

| සේවා ගාස්තු විස්තරය | උප වගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය | | | උප වගන්ති 10 ,11 ,12, 13, 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය |
|---|---|---|---|---|
| | උප වගන්ති 8 යටතේ (රු.) | උප වගන්ති 9 යටතේ (රු.) | උප වගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන් (රු.) | (රු.) |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්ථයක් වශයෙන් පදනම්කරගෙන ප්‍රාදේශී සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරය කරණු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"සමෘද්ධි ලාභීන්" යනුවෙන් හඳුනා ගන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිළිඳුකම පිටුදැකීම ව්‍යාපාරය යටතේ අධාර ලබන්නන් ද, එයට අදාළ වේ.

07-644/4

---

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු

බලතල අනුව දෙහිඅත්තකණ්ඩිය් ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්,
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය,

දෙදහස් දොළහ වර්ෂයේ ජුනි මස 25 වැනි දින,
මහ ඇමති කාර්යාලය,
නැගෙනහිර පළාත,
වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

## දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතල අනුව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතල අනුවද දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2012.03.30 දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 10/03/1 දරන තීරණය මත මෙම අතුරු ව්‍යස්ථාව සකස් කර සම්මත කරණු ලැබේ.

*පොදු :*

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍ර අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍ර ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ/ඇයගේ පරිශ්‍ර තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරන ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරන ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකල යුත්තේය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කළ විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උපවගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු, නිවැසියන්ගේ ,අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරි වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේය.

(vii) උපවගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතුය :-

(අ) මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊළඟ මස 15 දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය;

(ආ) වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 දිනට පෙර ගෙවිය යුතු ය;

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට/ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරණ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය :-

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි ; හෝ

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතු වන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවට භාරදිය යුත්තේය.

(v) සෑම තැනැත්තෙක්ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේය.

(vii) නිවසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම් පත්‍රයේ ඇතුළත් කළ යුත්තේය.

*නිවාස පරිශ්‍රයන්* :

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡෙදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) සෑම හිමිකරුවෙකුට ම හෝ පදිංචිකරුවෙකුට ම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු /ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාළ අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක් රැස් කරන්නන්ට භාරදිය යුතු ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර, සැපයිය යුතු අතර, ඒවා පවිත්‍ර හා සනීපාරක්‍ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය.

(iii) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වැනි උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. *සාප්පු හා කාර්යාල*

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය; ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන්කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේය.

(v) (iv) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුළට දැමිය යුතු වන්නේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන්ව ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළහොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්‍ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් -

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

11. *භෝජනාගාරය*

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේය.

- *(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
- *(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
- *(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
- *(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක් ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුම් ඇසිරිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස-

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

12. *එළවළු සහ පළතුරු වෙළඳසැල්*

(i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

- *(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
- *(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
- *(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
- *(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල්වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි*

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය:.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය .

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුළත තැබිය යුතු අතර එය නිසි ලෙස සුරක්ෂිත බහාලුමක තැන්පත් කර තැබිය යුත්තේය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියාගෙන් ඉල්ලුම් කළ යුතු ය.

(iii) උප වගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උප වගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩුකර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසියම් අපද්‍රව්‍යක් පදික වේදිකාවේ, මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හා සතුන් විසින් කා දමනු ලැබිය හැක්කායවූත්

අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථාවල දී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතු ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්ත ශාලා*

(i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එකතු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය ඃ

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කර්මාන්තශාලාව'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාළ වන්නේය.

16. *කැණීම, ඉදිකිරීම සහ කඩා දැමීම*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකුද ඇතුළත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේ දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම්වරයා දැනුම් දිය යුතු ය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වන උප වගන්තිය යටතේ කරණු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම්වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරණු ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කළ හැකිය.

(iii) උප වගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර, ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උප වගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා*

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වන උප වගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වන උප වගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වන උප වගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස

''ආරෝග්‍යශාලාව,, යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුවද) වන අතර, සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය, යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය ශරීර කොටස්, වැදැමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ත්ව ඝාතකාගාර*

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර අඥාපනතේ (272 පරිච්ඡේදයේ) විධිවිධානවලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතුය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උප වගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් සන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ :-

(අ) සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය;

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දුනොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර, එයට මැස්සන්, මීයන්, කෘමින් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වන උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) සත්ත්ව ඝාතකාගාර මඟින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේය.

''සත්ත්ව ඝාතකාගාරය,, යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව අඥා පනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර*

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය ፡

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේය.එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කළින් කලට තීරණය කරණු ලබන සේවා ගාස්තුවකට අනුකූලවේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කළින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

21. *වීදි සහ පොදු ස්ථාන*

(i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය ፡-

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම.

*(ඇ)* උත්සවවල දී විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම.

*(ඈ)* නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක්වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

*(ඉ)* පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම*

(i) ලේකම්වරයා සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේය.

*(අ)* අපද්‍රව්‍ය ජනනයවීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට, නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම.

(උ) තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(එ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරි අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(ඒ) අන්තරාකාරි අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම්වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

(ඔ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඕ) මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරාකාරි අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ක) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

(ග) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(ජ) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(ට) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම.

(ඩ) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

(ද) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුළත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. *බලපත්‍ර :*

(i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වු හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

*(ආ)* සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත හෝ වෙනත් පලාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ඇ)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඈ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

*(ඉ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

*(ඊ)* අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුලත කරගෙන යනු ලබන විටෙකදී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

*(උ)* සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය.

*(ඌ)* ලේකම්වරයා විසින් වලංගු කාලපරිච්ඡේදය තුල එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේය.

*(එ)* (ii) වන උප වගන්තියේ විධි විධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය.

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ* :

*(i)* සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේය.

*(ii)* අනුමත කිරීමේ යම් කොන්දේසි වලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේය.

25. *වෙනත්* :

*(i)* ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේය.

*(ii)* එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

*(iii)* මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

*(iv)* සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු වයවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

*(v)* මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම්* :

(i) මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම උප වගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධිවිධාන උල්ලංඝනය කළහොත් හෝ නොසැළකිල්ල කලහොත් ලේකම්වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කළ යුතු චෝදනාවක් වේ.

*(අ)* යම් ආකාරයකින් එවැනි උල්ලංඝනයක් හෝ නොසැළකිල්ලතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක් ,

*(ආ)* එසේ උල්ලංඝනය හෝ නොසැළකිල්ලතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ.

27. *අර්ථ නිරූපනය :*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්‍ෂුද්‍රජීවී කාරකයන් මඟින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්‍ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්‍ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවුත්, සැකසුම් නොකරණ ලද්දාවුත් පිරියම් නොකර ලද්දාවුත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුලත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස්, බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස් වලින් හෝ පැල වලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරි අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දැවෙනසුලු ප්‍රතික්‍රියා දක්වනසුලු රෝග කාරක විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දැවෙන සුලු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණ ශිලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියොජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුලත් වන අතර, වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

' 'සභාව'' යන්නෙන් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කි වලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැඟිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල, යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේදී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

**උපලේඛනය 01**

සේවා ගාස්තු :

| *සේවා ගාස්තු විස්තරය* | *උප වගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය* | | | *උප වගන්ති 10 ,11 ,12, 13 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය* |
|---|---|---|---|---|
| | *උප වගන්ති 8 යටතේ* | *උප වගන්ති 9 යටතේ* | *උප වගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන්* | |
| | *(රු.)* | *(රු.)* | *(රු.)* | *(රු.)* |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්තයක් වශයෙන් පදනම් කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරණය කරනු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

“සමෘද්ධිලාභීන් ” යනුවෙන් හඳුනා ගන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ගකර ඇති අතර, රජයෙන් දිළිඳුකම පිටුදැකීම ව්‍යාපාරය යටතේ ආධාර ලබන්නන් ද එයට අදාළ වේ.

07-644/5

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත මඟින් මාහට පැවරුණු බලතල අනුව ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්,
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය.

දෙදහස් දොළහ වර්ෂයේ ජූනි මස 25 වැනි දින,
මහ ඇමති කාර්යාලය,
නැගෙනහිර පළාත,
වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතලය අනුවද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතලය අනුවද ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව විසින් 2011.11.24 වැනි දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 06 දරන තීරණය මත මෙම අතුරු ව්‍යස්ථාව සකස් කර සම්මත කරණු ලැබේ.

*පොදු :*

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුලත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ / ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරණ ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකල යුත්තේය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කල විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උපවගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරි වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකල යුත්තේය.

(vii) උප වගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතු ය.

*(අ)* මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊළඟ මස 15 වැනි දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය.

*(ආ)* වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 වැනි දිනට පෙර ගෙවිය යුතු ය.

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකල යුත්තේය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුල විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකල යුත්තේය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට /ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුලතම බැහැර කළ හැකිය.

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි ; හෝ

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කල හැකිය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුලත එකතු වන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවේ භාරදිය යුත්තේය.

(v) සෑම තැනැත්තෙක්ම ඔහුගේ / ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකල යුත්තේය.

(vii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ / ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රයේ ඇතුලත් කළ යුත්තේය.

*නිවාස පරිශ්‍රයන්* :

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡේදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු /ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාල අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක් රැස් කරන්නන්ට භාරදිය යුතු ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය;
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය :-

(iii) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාල බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතුය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. *සාප්පු හා කාර්යාල*

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය;
(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබනතුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේය.

(v) (iv) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුළට දැමිය යුතු වන්නේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළහොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vii) අසල්වාසීන්ට හෝ ඒකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් -

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය;

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම ඇත ;

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළෙඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුලත් වේ.

11. *භෝජනාගාරය :*

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මද්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

12. *එළවළු සහ පළතුරු වෙළෙඳසල් :*

(i) සෑම එළවළු හෝ පළතුරු වෙළෙඳ සලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුලට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල්වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි ඃ*

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.:-

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණු හෝ මළකුණු වල කොටස් හෝ බිත්තර;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය .

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුලත තැබිය යුතු අතර එම නිසි ලෙස සුරක්ෂිත බහාලුමක කර තැබිය යුත්තේය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම ඃ*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම් වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියාගෙන් ඉල්ලුම් කළ යුතුය.

(iii) උප වගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උප වගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසියම් අපද්‍රව්‍යක් පදික වේදිකාවේ මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේය.

(v) පදික වෙළෙන්දෙක් වාහන වල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුලට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හා සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථාවල දී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා*

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිශ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුල ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කර්මාන්තශාලාවම'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාළ වන්නේය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් ඒකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුලත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුලත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේදී දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් විදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම්වරයා දැනුම් දිය යුතුය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වැනි උපවගන්තිය යටතේ කරණු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම් වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරණු ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කල හැකිය.

(iii) උප වගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උපවගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා* :

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරණ ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස,

''ආරෝග්‍යශාලාව,, යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

“උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය”, යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ත්ව ඝාතකාගාර* :

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර අඥාපනතේ (272 පරිච්ඡෙදයේ) විධි විධානවලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතුය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උප වගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් සන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.

*(අ)* සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දුනොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) සත්ත්ව ඝාතකාගාර මඟින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරණ ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේය.

''සත්ත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව අඥාපනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සදහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර* :

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේය.එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරණු ලබන සේවා ගාස්තුවකට අනුකූලවේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

21. *වීදි සහ පොදු ස්ථාන* :

(i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය.

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම.

*(ඇ)* උත්සවවල දී විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම.

*(ඈ)* නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

*(ඉ)* පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම :*

(i) ලේකම්වරයා සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේය.

*(අ)* අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම.

*(ආ)* අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

*(ඇ)* ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

*(ඈ)* අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම.

*(ඉ)* අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

*(ඊ)* ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම.

*(උ)* තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

*(ඌ)* බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

*(එ)* බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

*(ඒ)* අන්තරාකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම්වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

*(ඔ)* ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

*(ඕ)* මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරාකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

*(ක)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

*(ග)* අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

*(ජ)* නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

*(ට)* සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

*(ඩ)* 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

(ද) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුළත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. බලපත්‍ර :

(i) අපද්‍රව්‍ය ප්‍රති භාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

(ආ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

(ඉ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

(ඊ) අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

(උ) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය.

(ඌ) ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේය.

(එ) (ii) වැනි උපවගන්තියේ විධි විධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය.

24. අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ :

(i) සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේය.

(ii) අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේය.

25. වෙනත් :

(i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු ,කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

(iv) සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම් :*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මෙම උපවගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධිවිධාන උල්ලංඝනය කලහොත් හෝ නොසැළකිල්ල කලහොත් ලේකම්වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කළ යුතු චෝදනාවක් වේ.

*(අ)* යම් ආකාරයකින් එවැනි උල්ලංඝණයක් හෝ නොසැළකිලි තාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක් ;

*(ආ)* එසේ උල්ලංඝණය හෝ නොසැළකිලි දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ .

27. *අර්ථ නිරූපනය :*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්‍ෂුද්‍රජීවී කාරකයන් මඟින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්‍ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්‍ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරණ ලද්දාවූත්, පිරියම් නොකර ලද්දාවූත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුළත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස්, බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැලවලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරි අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් අටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුළත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේ දී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරු කිරීම එහි දී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

උපලේඛන 01

**සේවා ගාස්තු**

| *සේවා ගාස්තු විස්තරය* | *උපවගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය* | | | *උප වගන්ති 10 ,11 ,12, 13, 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය* |
|---|---|---|---|---|
| | *උපවගන්ති 8 යටතේ* | *උපවගන්ති 9 යටතේ* | *උපවගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන්* | |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්ථයක් වශයෙන් පදනම්කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරය කරනු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

සමෘද්ධිලාභීන් යනුවෙන් හඳුනා ගන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිළිඳුකම පිටුදැකීම ව්‍යාපාරය යටතේ අධාර ලබන්නන් ද එයට අදාළ වේ.

07-644/6

---

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් මහ ඇමති හා මුදල් සහ ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු බලතල අනුව පොතුවිල් ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,<br>
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,<br>
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්,<br>
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,<br>
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය,

දෙදහස් දොළහ වර්ෂයේ ජුනි මස 25 වැනි දින,<br>
මහඇමති කාර්යාලය,<br>
නැගෙනහිර පළාත,<br>
වරෝදය නගර්,<br>
ත්‍රිකුණාමලය.

## පොතුවිල් ප්‍රාදේශීය සභාව

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතලය අනුව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතලය අනුවද පොතුවිල් ප්‍රාදේශීය සභාව විසින් 2011.11.24 දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 89/2011 දරන තීරණය මත මෙම අතුරු ව්‍යස්ථාව සකස් කර සම්මත කරනු ලැබේ.

**පොදු**

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම ඔහුගේ / ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරණ ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකල යුත්තේය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කල විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උපවගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්‍ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරි වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකල යුත්තේය.

(vii) උප වගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතු ය.

(අ) මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊලග මස 15 දිනට පෙර එම මුදල් ගෙවිය යුතුය.

(ආ) වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 දිනට පෙර ගෙවිය යුතුය.

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකල යුත්තේය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුල විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකල යුත්තේය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරණ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට /ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරණ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුලතම බැහැර කළ හැකිය.

(අ) සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි හෝ
(ආ) සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම් වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කල හැකිය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුලත එකතු වන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම් වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවට භාරදිය යුත්තේය.

(v) සෑම තැනැත්තෙක්ම ඔහුගේ / ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකල යුත්තේය.

(vii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ / ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

*නිවාස පරිශ්‍රයන්*

8. (i) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡේදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) සෑම හිමිකරුවෙකුට ම හෝ පදිංචි කරුවෙකුට ම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාළ අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදිය යුතු ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැඟිල්ලක සෑම අයිතිකරුවෙක් ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර, සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය.

(iii) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වැනි උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන්කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

10. *සාප්පු හා කාර්යාල*

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(v) (iv) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුළට දැමිය යුතු වන්නේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන්ව ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළහොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්‍ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්තයක් අවශ්‍ය වන්නේ නම් -

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

11. *භෝජනාගාරය*

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුම්වල ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

12. *එළවළු සහ පළතුරු වෙළඳසැල්*

(i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳ සැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

- *(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
- *(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
- *(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
- **(ඈ)** සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි*

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

- *(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
- *(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
- *(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
- *(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුළත තැබිය යුතු අතර එය නිසි ලෙස සුරක්ෂිත බහාලුමක කර තැබිය යුත්තේ ය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යයන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියා ගෙන් ඉල්ලුම් කළ යුතු ය.

(iii) උපවගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උපවගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම් වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසියම් අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හා සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළඳාම් සිදු නොකරන අවස්ථාවල දී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතු ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පදික වෙළඳාම'' යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා*

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍යවර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කර්මාන්තශාලාවම'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාළ වන්නේය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේ දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේ ය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම්වරයා දැනුම් දිය යුතුය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වැනි උපවගන්තිය යටතේ කරනු ලබන විධිවිධාන වලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම්වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරන ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කල හැකිය.

(iii) උපවගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උපවගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා*

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස -

''ආරෝග්‍යශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රවකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ව ඝාතකාගාර*

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර ආඥාපනතේ (272 පරිච්ඡේදයේ) විධිවිධානවලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුෂ්‍ය භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උපවගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් සන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ :-

*(අ)* සත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දු නොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේ ය. එසේ නොමැති ප්‍රාදේශීය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vi) සත්ව ඝාතකාගාර මඟින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේය.

''සත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ව ආඥාපනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර*

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේ ය.එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන සේවා ගාස්තුවකට අනුකූල වේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

21. *වීදි සහ පොදු ස්ථාන*

(i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය :-

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;

(ඇ) උත්සව වලදී විශේෂ සිදුවීම් අවස්ථා වලදී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථා වලදී සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම.

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම :*

(i) ලේකම්වරයා සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේය.

(අ) අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතු වල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට පදිංචිකරුවන්ට ලබාදීම.

(උ) තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුලත් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(එ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(ඒ) අන්තරාකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම් වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

(ඔ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුලත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ග වල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම් වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඕ) මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරාකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ක) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසි වලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

(ග) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(ජ) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේදී හා නිමවීමේදී සක්කගල් ගබඩා කරනු, සකසණු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(ට) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

(ඩ) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

(ද) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුළත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. *බලපත්‍ර :*

(i) අපද්‍රව්‍ය ප්‍රති භාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

(ආ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

(ඉ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

(ඊ) අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙකදී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

(උ) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය.

(ඌ) ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දක්විය යුත්තේය.

(එ) (ii) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ :*

*(i)* සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේය.

*(ii)* අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේය.

25. *වෙනත් :*

*(i)* ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේය.

*(ii)* එම පරිශ්‍රයේ හිමිකරු , පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

*(iii)* මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

*(iv)* සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

*(v)* මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම්*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මෙම උපවගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධිවිධාන උල්ලංඝනය කලහොත් හෝ නොසැලකිල්ල කළහොත් ලේකම්වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කළ යුතු චෝදනාවක් වේ.

*(අ)* යම් ආකාරයකින් එවැනි උල්ලංඝනයක් හෝ නොසැලකිලිතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක් ;

*(ආ)* එසේ උල්ලංඝනය හෝ නොසැලකිලිතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ.

27. *අර්ථ නිරූපනය*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වූත් ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත් සැකසුම් නොකරන ලද්දාවූත් පිරියම් නොකර ලද්දාවූත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස්, බිත්තර හා එළවළු, පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස් වලින් හෝ පැල වලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක වියහැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් අටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියොජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

' 'සභාව'' යන්නෙන් තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇලක්, දොලක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහ ජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුළත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විථි ශුද්ධ කිරීමේදී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

උපලේඛන 01

**සේවා ගාස්තු**

| සේවා ගාස්තු විස්තරය | උපවගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය | | | උප වගන්ති 10 ,11 ,12, 13 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය |
|---|---|---|---|---|
| | උපවගන්ති 8 යටතේ (රු.) | උපවගන්ති 9 යටතේ (රු.) | උපවගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන් (රු.) | (රු.) |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්ථයක් වශයෙන් පදනම් කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරණය කරනු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"සමෘද්ධිලාභීන්"යනුවෙන් හඳුනාගන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිළිඳුකම පිටුදැකීම ව්‍යාපාරය යටතේ අධාර ලබන්නන් ද එයට අදාළ වේ.

07-644/7

---

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් මහ ඇමති මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, ග්‍රාම සංවර්ධන, මිනිස් බල, නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය වන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 123(1) සහ (2) සමඟ කියවනු ලබන 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත මගින් මාහට පැවරුණු බලතල අනුව නින්දවූර් ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අනුමත කර, ඉන්පසු සඳහන් කරනු ලබන දිනයට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කිරීමට ද නියෝග කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
නැගෙනහිර පළාත් මහ ඇමති සහ මුදල් හා ක්‍රම සම්පාදන,
පළාත් පාලන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්,
ග්‍රාම සංවර්ධන, මිනිස් බල,
නීතිය හා විධාන, පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍ය,

2012 ජූනි මස 25 වැනි දින,
මහ ඇමති කාර්යාලය,
නැගෙනහිර පළාත,
වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

## නින්දවූර් ප්‍රාදේශීය සභාව

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

නින්දවූර් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය සහ 122 හා 126 (IX) (ආ) වගන්ති යටතේ පවරනු ලබන බලතලය අනුවද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය යටතේ පළාත් සභාව පවරනු ලබන බලතලය අනුවද නින්දවුර් ප්‍රාදේශීය සභාව විසින් 22.03.2012 දිනැති පවත්වනු ලබන රැස්වීමේ දී අංක 27 දරන තීරණය මත මෙම අතුරු ව්‍යවස්ථාව සකස් කර සම්මත කරණු ලැබේ.

*පොදු*

01. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

02. නින්දවුර් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කිරීමට හේතු විය යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ / ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 08 සිට 21 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව කිරීම හෝ වෙන් කිරීමට හේතු විය යුත්තේය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට අනුමත කරණ ලද ප්‍රමිතිය සහ නියමාකාරය අනුව විය යුතු අතර හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකල යුත්තේ ය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු ඔහු කැමැත්ත ප්‍රකාශ කල විට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ලබා ගන්නා වූ තීරණය අනුව ප්‍රකාශිත බඳුන් හෝ බහාලුම් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකිය.

(v) හිමිකරු හෝ පදිංචිකරු විසින් එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන්නාවූ එක්රැස් කරන්නාවූ ක්‍රියාපටිපාටිය, කාලසටහන පොදු නිවේදනයක් මඟින් දැනුම් දීමෙන් උපවගන්ති (i) ප්‍රකාරව බැහැර කළ හැක.

(vi) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකල යුත්තේ ය.

(vii) උප වගන්ති 08 සිට 09 ,10, 11, 12, 13, 15, 18, 19 දක්වා සඳහන් කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් ගෙවිය යුතු ය.

*(අ)* මාසිකව මුදල් ගෙවනු ලබන පිරිස් ඊළඟ මස 15 වැනි දිනට පෙර එම මුදල් ගෙවිය යුතු ය.

*(ආ)* වාර්ෂිකව සේවා ගාස්තු ගෙවනු ලබන අයවලුන් වර්ෂයේ මාර්තු මස 28 වැනි දිනට පෙර ගෙවිය යුතු ය.

6. (i) කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකල යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකල යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට /ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය.

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි, හෝ

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුලත එකතු වන ගෙවතු අපද්‍රව්‍ය හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(iv) වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවේ භාරදිය යුත්තේය.

(v) සෑම තැනැත්තෙක්ම, ඔහුගේ / ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vi) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යක් වාහනයක සිට වීදියට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(vii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ / ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ / ඇයගේ අයදුම් පත්‍රයේ ඇතුලත් කළ යුත්තේ ය.

*නිවාස පරිශ්‍රයන්* :-

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය.(i) ඡේදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය සහ මීයන්, කෘමින් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචි කරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු / ඇය (ඇ) සහ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාල අපද්‍රව්‍ය ප්‍රාදේශීය අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදිය යුතුය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) (i) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර සැපයිය යුතු අතර ඒවා පවිත්‍ර හා සනීපාරක්‍ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය.

(iii) (i) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i) (ii) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවකදී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගන්නා එලෙස හේතු වීමට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇති අතර, ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාල බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. *සාප්පු හා කාර්යාල :*

(i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(v) (iv) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් තුලට දැමිය යුතු වන්නේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට හැකිය. එසේ කිරීම නොකළ හොත් එම අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vii) අසල්වාසීන්ට හෝ ඒකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් -

''පදිංචිකරු'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ (129 වන අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුලත් වේ.

11. *භෝජනාගාරය :*

(i) යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) සෑම භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යක් සහ (i) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''භෝජනාගාරය'' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක්ද ඇතුළත් වේ.

12. *එළවළු සහ පලතුරු වෙළඳසැල් :*

(i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳ සැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුලට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල් වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''එළවළු හා පළතුරු වෙළඳසැල් '' යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පලතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

13. *මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි :*

(i) කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක ඇතුලත තැබිය යුතු අතර, එම නිසි ලෙස සුරක්ෂිත බහාලුමික කර තැබිය යුත්තේය. (අ), (ආ), (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනත් බහාලුමක මැස්සන් ,මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන්.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකු හට භාරදිය හැක්කේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ,

''මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි '' එවැනි ද්‍රව්‍යයන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ.

14. *පදික වෙළඳාම*

(i) ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළෙඳාමේ යෙදී සිටිය නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකරගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාල වෙළෙඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියාගෙන් ඉල්ලුම් කළ යුතු ය.

(iii) උපවගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව ඒ සඳහා වූ සේවා ගාස්තුව උපවගන්ති (ii) හි ලබා ගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි.

(iv) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසියම් අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේය.

(v) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂි අපද්‍රව්‍ය.

(vii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනත් බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූත් අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේය.

(viii) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේය.

(ix) කිසියම් පදික වෙළෙන්දෙකු අපද්‍රව්‍ය සහිත වූ බහාලුම් වෙළෙඳාම් සිදු නොකරන අවස්ථාවල දී පදික වේදිකාවේ හෝ වීදි ආසන්නයේ හෝ මහාමාර්ගයේ නොතැබිය යුතු ය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"පදික වෙළඳාම" යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

15. *කර්මාන්තශාලා*

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"කර්මාන්තශාලාව'' යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාල වන්නේය.

16. *කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම*

(i) යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා'' කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේදී දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

17. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීදියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් අයදුම්පත්‍රයක් ලේකම්වරයාට ඉදිරිපත් කර ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය. යෝජිත කාර්යය අවසන් වීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයේ තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් යම් ගෙවීමක් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අත්තිකාරම් ලෙස ඉල්ලුම්කරුට ගෙවන ලෙස ලේකම්වරයා දැනුම් දිය යුතුය.

(ii) කිසියම්ම කෙනෙකු ඉහත (i) වැනි උපවගන්තිය යටතේ කරනු ලබන විධිවිධානවලට නොඅනුකූලව ක්‍රියාකරයි නම් එවැනි අනුමැතිය දීමට පෙර ලේකම්වරයා එම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු කළ වියදමට සමාන මුදලක් ඉල්ලුම් කළ තැනැත්තා විසින් තැන්පත් කරනු ලෙසට ලේකම්වරයා ඉල්ලීමක් කළ හැකිය.

(iii) උප වගන්ති (i) හෝ (ii) යටතේ ලබාගත් බලපත්‍රය අනුව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණය හෝ කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම් උපවගන්ති (i) හි තැන්පත් කරන මුදලට හිලව් කරනු ලැබේ.

18. *ආරෝග්‍යශාලා* :

(i) සියලුම ආරෝග්‍යශාලා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතු ය. ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* උපද්‍රවකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය.

(ii) (i) වන උප වගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි

විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේය.

(iii) (i) වන උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස,

''ආරෝග්‍යශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ ස්තුති පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක් / සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රව්‍යකාරි සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදන වන සුළු සහ අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ.

19. *සත්ත්ව ඝාතකාගාර* :

(i) යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර අඥාපනතේ (272 පරිච්ඡේදයේ) විධි විධානවලට නොඅනුකූලව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එකී පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මනුස්ස භෝජනයට නුසුදුසු කොටස් සහ ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතුය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උප වගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ) ඔවුන් ඝන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.

*(අ)* සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකටු හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දු නොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර එයට මැස්සන්, මීයන්, කෘමින් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේය. එසේ නොමැති ප්‍රාදේශිය සභාවල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) සත්ත්ව ඝාතකාගාර මඟින් ජනනය වන කුණු වතුර සම්බන්ධයෙන් 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේය.

''සත්ත්ව ඝාතකාගාරය'' යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව අඥාපනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපනයට අදාළ වේ.

''මස් වෙළඳ කුටිය'' යන්නෙන් අදහස් කරන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්ය සඳහා ගබඩා කර ඇති හෝ අලෙවිය සඳහා තබා ඇති හෝ අලෙවිය සඳහා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

20. *වෙනත් පරිශ්‍ර* :

(i) අංක 08 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය;
*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේ ය. එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එක්ලස් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරණු ලබන සේවා ගාස්තුවකට අනුකූල වේ.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

21. *වීදි සහ පොදු ස්ථාන* :

(i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡාකර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතු යඃ-

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි වීදි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;

*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;

*(ඇ)* උත්සවවලදී විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැකසීම;

*(ඈ)* නේවාසික ප්‍රදේශයන්හි ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත්කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම;

*(ඉ)* පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන්කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙත සහිත වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

22. *ප්‍රාදේශීය සභාවේ යුතුකම* :

(i) ලේකම්වරයා සභාපතිවරයා සමඟ සාකච්ඡාකර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය :-

*(අ)* අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම;

*(ආ)* අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම;

*(ඇ)* ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම;

*(ඈ)* අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම;

*(ඉ)* අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම;

*(ඊ)* ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලබන තත්ත්වය අනුව පිළිගත හැකි අවශ්‍යතාවය අනුව උර, ගෝනි, බහාලුම්,බඳුන් කාර්යක්ෂමව අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම සහ ගබඩා කිරීම සඳහා නිවෙස් හිමියන්ට, පදිංචිකරුවන්ට ලබාදීම;

*(උ)* තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්ය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්ය සටහනට ඇතුළත් කිරීම;

*(ඌ)* බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම;

(එ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරාකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(ඒ) අන්තරාකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදී අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම් වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීම.

(ඔ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ ඇතුලත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ග වල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම් වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඕ) මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡාකර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරාකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ක) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසි වලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

(ග) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරත වන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම් අත් ආවරණ මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(ජ) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සහ සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේදී හා නිමවීමේදී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(ට) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

(ඩ) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාල නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙන් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂික අනුමත කරනු ලැබීම.

(ද) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාල වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුලත් වෙනත් පැමිණිල්ලක් නම් දින 14 ක් ඇතුලත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

23. *බලපත්‍ර*

(i) අපද්‍රව්‍ය ප්‍රති භාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) වගන්ති (ඌ) ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගුකර තිබෙන යම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය ලබා ගැනීමට හෝ එක්රැස් කළ නොහැක.

(ආ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුලත හෝ වෙනත් පලාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

(ඉ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

(ඊ) අදාල ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුලත කරගෙන යනු ලබන විටෙකදී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟ වීම.

(උ) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුලත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය.

(ඌ) ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුල එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රාදේශීය සභා වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(එ) (ii) වන උප වගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය.

24. *අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ*

(i) සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමට කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේය.

(ii) අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

25. *වෙනත්*

(i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලූ සාධාරණ වේලාවන්හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු පදිංචිකරු භාරකරු කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම් වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහි ලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

(iv) සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන යම් බලය ලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

26. *උල්ලංඝනය කිරීම් සහ දඬුවම්*

(i) මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මෙම උප වගන්තියේ 03 සිට 20 දක්වා සහ 23 සිට 25 දක්වා වූ විධිවිධාන උල්ලංඝනය කළහොත් හෝ නොසැළකිල්ල කළහොත් ලේකම්වරයාගේ ලිඛිත දැනුම් දීම ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණය විසින් පහත පරිදි දඬුවම් කල යුතු චෝදනාවක් වේ.

*(අ)* යම් ආකාරයකින් එවැනි උල්ලංඝණයක් හෝ නොසැළකිල්ලතාවයක් සම්බන්ධව රු. 750.00 ක දඩයක් ;

*(ආ)* එසේ උල්ලංඝණය හෝ නොසැළකිල්ලතාවය දිගින් දිගටම සිදු වුවහොත් දිනකට රු. 250.00 බැගින් අමතර දඩ .

27. *අර්ථ නිරූපනය*

මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''බලයලත් එක්රැස්කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක් බඳුනක් උරයක් මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය'' යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''එක්රැස් කිරීම'' යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය , සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

''කොම්පෝස්ට්'' යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්‍ෂුද්‍රජීවී ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්‍ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දා වූත් ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත් සැකසුම් නොකරණ ලද්දාවූත් පිරියම් නොකර ලද්දාවූත් සියලූම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුලත හෝ තැම්පත් කිරීම අදහස් කෙරේ.

''ගාස්තුව'' යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

''ආහාර අපද්‍රව්‍ය'' යන්නෙන් මිනිස් පාරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස් මාළු කුකුල් මස් බිත්තර හා එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ගෙවතු අපද්‍රව්‍ය'' යන්නෙන් ගෙවත්තක පිහිටි ගස් වලින් හෝ පැල වලින් ඉවත් කෙරෙන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල් පස් ආදිය අදහස් කෙරේ.

''උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය'' යන්නෙන් මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ආසාදිත අපද්‍රව්‍ය'' යන්නෙන් රෝග වහනය කිරීමට දායක විය හැකි භාජන පර්යේෂණ සඳහා භාවිතා වන්නා වූ භාජන හා මහජන සෞඛ්‍යට හෝ පරිසරයට හානි දායක වන විෂ සහිත දූවෙන සුළු ප්‍රතික්‍රියා දක්වන සුළු රෝග කාරක විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු ඇතුලත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියාකරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

' 'සභාව'' යන්නෙන් නින්දවූර් ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 වැනි අධිකාරය) බලය යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කි වලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක් රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

''පොදු ස්ථානය'' යන්නෙන් පාර, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්‍ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

''ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදා ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''සනීපාරක්‍ෂක බිම් පිරවුම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''ලේකම්'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ග වලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය'' යන්නෙන් ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විථි ශුද්ධ කිරීමේදී එකතු වන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය

කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

උපලේඛන 01

සේවා ගාස්තු :

| *සේවා ගාස්තු විස්තරය* | *උප වගන්ති 8 සහ 9 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය* | | | *උප වගන්ති 10 ,11 ,12, 13 15 ,18 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචි කරුවන් වර්ගය* |
|---|---|---|---|---|
| | *උප වගන්ති 8 යටතේ* | *උප වගන්ති 9 යටතේ* | *උප වගන්ති 8 සහ 9 යටතේ සමෘද්ධිලාභීන්* | |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| එක් මාසයක් සඳහා සේවා ගාස්තු | 50 | 75 | 30 | *- |
| එක් වර්ෂයක් සඳහා සේවා ගාස්තු | 600 | 900 | 360 | *- |
| මුළු වර්ෂය සඳහාම මාර්තු මාසයට පෙර සේවා ගාස්තු ගෙවූ විට මුදලින් 10% ක වට්ටමක් පිරිනැමීම | 540 | 810 | 325 | *- |

*- ඉවත් කරනු ලබන අපද්‍රව්‍යයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමස්ථයක් වශයෙන් පදනම් කරගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සේවා ගාස්තු තීරණය කරණු ලබයි.

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

*සමෘද්ධි ලාභීන්* : යනුවෙන් හඳුනා ගන්නේ අදාල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ආධාර පවුල වෙනුවෙන් වර්ග කර ඇති අතර රජයෙන් දිළිඳු කම පිටුදැකීම ව්‍යාපාරය යටතේ ආධාර ලබන්නන් ද එයට අදාල වේ.

07-644/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.